
වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றும்
ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS
පුනරුත්ථාපන අධිකාරිය
புனர்வாழ்வு அதிகாரசபை
REHABILITATION AUTHORITY
2012

පටුන

1. පිළිගැන්වීමේ ලිපිය.
2. වාර්ෂික වාර්තාව.
3. වාර්ෂික ගිණුම්.
4. විගණකාධිපතිගේ වාර්තාව.
5. විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳව සභාපතිගේ නිරීක්ෂණ.

<u>පිළිගැන්වීමේ ලිපිය.</u>

පාර්ලිමේන්තු මන්ත්‍රී සහ පුනරුත්ථාපන හා

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා ,

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,

නො. 35 ඒ,

ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මාවත,

කොළඹ 08.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනත 1987 අංක 29 දරණ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරී පනතේ විධිවිධාන ප්‍රකාර තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබතුමා වෙත සතුටින් පිළිගන්වමි.

මෙයට- විශ්වාසී,

ඊ.ඒ.සමරසිංහ,

සභාපති,

පුනරුත්ථාපන අධිකාරිය.

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය,

අංක. 59,

ඩී.එස්.සේනානායක මාවත,

කොළඹ 08.

දැක්ම

පුනරුත්ථාපනය තුලින් ආර්ථික හා සමාජීය
සෞභාග්‍ය උදා කිරීම.

මෙහෙවර

ජනවාර්ගික හා ගැටුම්, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හා ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් විපතට පත් ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්වයට පත් කර පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ තුළින් සංවර්ධනාත්මක සමාජ ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම.

වාර්ෂික වාර්තාව - 2012

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

(පුනරුත්ථාපන අධිකාරිය)

වර්ෂ 1987 අංක 29 දරණ පනත මඟින් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (පුනරුත්ථාපන අධිකාරිය) පිහිටුවන ලදි.

2012 වර්ෂයේ දී පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය.

1. ඒ.ඒ. සමරසිංහ මහතා - සභාපති
2. ඩී.කේ. ජිනදාස මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. ටී. ශ්‍රීධරන් මහතා - අධ්‍යක්ෂ
4. ඒ. සමූන් කලීල් මහතා - අධ්‍යක්ෂ
5. ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා - අධ්‍යක්ෂ

ත්‍රස්තවාදී ක්‍රියා, මහජන කැලඹීම්, දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා වලින් විපතට පත් පුද්ගලයින්ට, දේපළ සහ කර්මාන්තවලට සහන සැලසීම හා පුනරුත්ථාපනය කිරීම පුනරුත්ථාපන අධිකාරියට අයත් කාර්ය භාරය වන අතර, එම කාර්යයන් පහත දැක්වේ.

(අ) ව්‍යවස්ථාපිත කාර්යයන්

(අ) ත්‍රස්තවාදී ක්‍රියා නිසා විපතට පත්වූවනට සහන සැලසීම.

(ආ) විනාශ වූ / අලාභ හානි වූ නිවාස සහ දේපළ සඳහා අයිතිකරුවන් හට ආධාර සැපයීම.

(ඇ) විනාශ වූ / අලාභ හානි වූ නිවාස සහ දේපළවල පදිංචිව සිටි කුලී නිවැසියන්ට සහන සැලසීම.

(ඈ) විනාශයට පත් ගොඩනැගිලි ආදිය කඩාදැමීමට හා සුන්බුන් ඉවත් කිරීමට නියෝග කිරීම.

(ඉ) අලාභහානි වූ කර්මාන්ත හෝ වාණිජමය දේපළ වෙනුවෙන් ආධාර සැපයීම.

(ඊ) විනාශ වූ / අලාභ හානි වූ දේපළ රජයට පවරා ගැනීම.

(උ) රජයට පවරාගෙන ඇති දේපළ නියමිත හිමිකරුවන්ට ආපසු පවරාදීම.

(ඌ) රජයට පවරාගෙන ඇති දේපළවලට සම්බන්ධ අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පැන නගින ආරවුල් නිරවුල් කිරීම.

(ආ) වෙනත් කාර්යයන්

- (අ) ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිවාසාධාර ලබාදීම, නැවත පදිංචි කිරීමේ දීමනා සම්බන්ධීකරණය සහ පසුවිපරම් කිරීම.
- (ආ) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපළ විනාශවීම හෝ ඒවාට අලාභහානි සිදුවීම වෙනුවෙන් වන්දි ගෙවීම.
- (ඇ) ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වීම / තුවාල සිදුවීම / දේපළ හානි සිදු වීම වෙනුවෙන් වන්දි ගෙවීම.
- (ඇ) විනාශ වූ/ අලාභහානි වූ පූජනීය ස්ථාන පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර සැපයීම.
- (ඉ) විවාහ සමෘද්ධි දීමනා යෝජනා ක්‍රමය යටතේ ආධාර ගෙවීම.
- (ඊ) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විපතට පත් පුද්ගලයින්ට වන්දි ගෙවීම.
- (උ) නිවාස, ව්‍යාපාර හා කර්මාන්ත පුනරුත්ථාපනය සඳහා ණය පහසුකම් සැපයීම.
- (ඌ) අවතැන් වූ පුද්ගලයින්/ වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- (එ) යුද්ධයේ බලපෑමෙන් අසරණභාවයට පත්වූ පාසල් යන වයසේ දරුවන් ට ආධාර ලබාදීම.
- (ඒ) ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය.
- (ඔ) නිවාස ණය යෝජනා ක්‍රමය.

(ඇ) ක්‍රියාකාරකම් විස්තර කිරීම.

1. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය.

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය සහ එහි වර්තමාන අමාත්‍යාංශය වන පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් අවතැන් වූ තැනැත්තන් නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සඳහා ආධාර ප්‍රදානය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන හඳුන්වන්නේ "**ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය**" යනුවෙනි. මෙම යෝජනා ක්‍රමය හඳිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ 1983 වර්ෂයේ දී සකස් කරන ලද අතර, සපයන ආධාර වැඩි කිරීම සඳහා 1994 සහ 2002 වර්ෂවලදී දෙවරක්ම අදාළ වෙනස්කම් සිදුකරන ලදි. 2003.03.06 දින සිට මේ යටතේ ලබාදෙන නිවාසාධාර මුදල රු. 100,000.00 දක්වා වැඩිකර ඇත.

<u>ස්ථිර නිවාසාධාර රු. 100,000.00</u>

පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව, ඉහත ආධාර මුදල රු. 50,000.00 බැගින් වාරික දෙකකින් අවතැන්වූවන්ගේ විනාශවූ නිවාස නැවත ඉදිකර ගැනීම සඳහා ලබාදෙන ලදී.

- සමාලෝචිත වර්ෂය තුල දි ඉහත යෝජනා ක්‍රමය යටතේ පවුල් 426 ක් වෙනුවෙන් රු. 21,300,000.00 ක මුදලක් ගෙවන ලදී. මෙම සියළු පවුල් ප්‍රධාන වශයෙන් තෝරා ගැනෙනුයේ උතුරු නැගෙනහිර පළාත් වලිනි.

2. වන්දි/ මූල්‍යමය ආධාර

2.1 **<u>මරණ හා තුවාල වෙනුවෙන් වන්දි ගෙවීම.</u>**

(අ). **<u>රජයේ සේවක වන්දි.</u>**

(i) **මරණ වන්දි.**

ත්‍රස්තවාදී/ ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුකොට ගෙන රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයෙකුගේ මරණයක දී ඔහුගේ යැපෙන්නන් හට රු. 200,000.00 ක උපරිමයකට යටත්ව වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

(ii) **තුවාල සඳහා වන්දි.**

ත්‍රස්තවාදී/ ප්‍රචණ්ඩ ක්‍රියාවන් හේතුකොට ගෙන රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවකයෙකුට තුවාල සිදුවුවහොත්, එමගින් ඔහුට අහිමි වූ ඉපයීම් හැකියාව පිළිබඳව වෛද්‍ය මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය මණ්ඩල වාර්තාවක් පදනම් කර ගනිමින් රු.100,000.00 ක උපරිමයකට යටත්ව, වන්දි මුදලක් ගෙවීමට හැකියාවක් ඇත.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රම යටතේ මියගිය සහ තුවාල ලැබුවන් 24 දෙනෙකු වෙනුවෙන් රු. 2,700,000.00 ක මුදලක් ගෙවන ලදි.

(ආ). **<u>විශේෂ ශ්‍රේණියේ පුද්ගල වන්දි.</u>**

(i) **මරණ වන්දි.**

මෙම යෝජනා ක්‍රමය යටතේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතු කොටගෙන ඇමතිවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පවත්වන ලද මැතිවරණයක දී තේරීපත් නොවූ අපේක්ෂකයන්ගේ මරණයකදී ඔවුන්ගේ ආසන්නතම ඥාතීන්ට උපරිමය රු. 500,000.00 ක යටත්ව උපරිම වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

(ii) තුවාල වන්දි.

ඉහත සඳහන් විශේෂ ශ්‍රේණියේ පුද්ගලයින්ට තුවාල සිදුවූ අවස්ථාවක දී රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වාර්තාවට අනුව උපරිමය රු.500,000.00 ක වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

* සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

(ඇ) බලවත්සේ විපතට පත්වූවන් සඳහා වූ වන්දි ක්‍රමය.

ත්‍රස්තවාදී ක්‍රියා, ජනවාර්ගික ගැටුම්, මහජන කැලඹීම් සහ සම්බන්ධිත ආරක්ෂක මෙහෙයුම් හේතුකොට මියගිය තැනැත්තන්ගේ යැපෙන්නන් හට හෝ ඒ හේතුවෙන් තුවාල ලැබුවන්ට හෝ මෙම වන්දි ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වන්දි ලැබීමට හිමිකම් තිබේ.

* මරණයකදී රු. 100,000.00
* තුවාල සිදුවීමකදී උපරිම මුදල රු. 50,000.00

(මෙම මුදල වෛද්‍ය සහතිකයේ සඳහන් දුබලතාවයේ ප්‍රතිශතය මත තීරණය වේ.)

* සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 259 වෙනුවෙන් රු. 23,952,500.00 ක මුදලක් ගෙවන ලදි.

2.2 <u>හානි වූ / විනාශ වූ පෞද්ගලික දේපළ වෙනුවෙන් වන්දි ගෙවීම.</u>

(අ) රජයේ / රාජ්‍ය සංස්ථා සේවකයින්ට වන්දි ගෙවීම.

1987 ජුලි / අගෝස්තු මාස වලදී සහ ඉන්පසුව ඇති වූ ත්‍රස්තවාදී විපත් වලින් හානි වූ දේපළ වෙනුවෙන් රු.150,000.00 ක උපරිමය දක්වා වන්දි මුදලක් ලැබීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 49/89 යටතේ රජයේ සේවකයන්ට / සංස්ථා සේවකයන්ට හිමිකම් තිබේ.

* සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 149 වෙනුවෙන් රු. 13,448,279.00 ක මුදලක් ගෙවන ලදි.

(ආ) විශේෂ පුද්ගලයන්ට වන්දි ගෙවීම.

ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා ඇමතිවරුන්ට හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වලදී තේරීපත් නොවූ අපේක්ෂකයන්ට අයත් අලාභ හානි වූ / විනාශයට පත්වූ දේපළ වෙනුවෙන් පිළිවෙලින් රු.**500,000.00** සහ **150,000.00** ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට මෙමගින් ප්‍රතිපාදන සලසා ඇත.

- 2012 වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් කර නොමැත.

(ඇ) සාමාන්‍ය මහජනයා සඳහා දේපළ වන්දි ගෙවීම.

ඉහත සඳහන් යෝජනා ක්‍රම දෙක යටතේ ආධාර ලැබීමට හිමිකම් නොමැති විපතට පත් පුද්ගලයන්ට හා ඔවුන්ගේ හානි වූ / විනාශ වූ වාහන ද ඇතුළුව, දේපළ වෙනුවෙන් අලාභයෙන් **20%** ක මුදලක් උපරිමය රු. **100,000.00** කට යටත්ව ගෙවීම් කරනු ලැබේ.

මෙම වන්දි යෝජනා ක්‍රමය **1983** ජූලි මාසයේ සිට ආවරණය වන පරිදි **1996.02.16** වන දින සිට ක්‍රියාත්මක කෙරේ.

- සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් **201** දෙනෙකුට වන්දි වශයෙන් රු. **13,378,737.00** ක මුදලක් ගෙවන ලදි.

2.3 <u>හානියට පත් පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.</u>

ත්‍රස්තවාදී ක්‍රියා නිසා අලාභහානි වූ / විනාශයට පත් වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර දෙනු ලැබේ. මුළුමනින්ම විනාශ වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.**1,000,000.00** ක් ද, කොටසක් විනාශ වූ ස්ථාන සඳහා රු.**500,000.00** ක් ද ගෙවීම් කරනු ලැබේ.

- සමාලෝචිත වර්ෂය තුල දි ඉහත යෝජනා ක්‍රමය යටතේ පූජනීය ස්ථාන **02** සඳහා වන්දි වශයෙන් රු. **200,000.00** ක මුදලක් ගෙවන ලදී.

කිලිනොච්චි වයිරවර් හින්දු කෝවිල ප්‍රතිසංස්කරණය කිරීම.

3. <u>විවාහ සමෘද්ධි දීමනා.</u>

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් රජයේ සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන අතරතුර දී විවාහපත් වන පුද්ගලයෙකුට රු.**12,500.00** ක ආධාර මුදලක් ලැබීමට හිමිකම් තිබේ. සුළු පරිමාණයේ ආදායම් උපදන ආර්ථික කටයුතු ඇරඹීමට යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ඉහත ආධාර සපයනු ලැබේ. විවාහපත් වන යුවල රජය විසින් නඩත්තු කරන ලබන සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන තැනැත්තන් වේ නම් එම ආධාර මුදල දෙගුණ වී ඔවුන්ට රු. **25,000.00** ක මුදලක් ගෙවනු ඇත.

මෙම යෝජනා ක්‍රමය **1995** වර්ෂයේ ජූලි මාසයේ දී හඳුන්වා දෙන ලදී.

- ♦ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ එක් පවුල් ඒකකයක් සඳහා රු. **25,000.00** ක දීමනාවක් ලබාදී ඇත.

4. <u>පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමය.</u>

(i). කර්මාන්ත ණය.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් හානියට පත් ලියාපදිංචි කර්මාන්ත නැවත ආරම්භ කිරීම සඳහා **9%** ක පොලී අනුපාතයක් සහ ආපසු අයකර ගැනීමේ කාලය අවුරුදු **10** කට යටත්ව එක් කර්මාන්තයකට රුපියල් මිලියන **05** ක උපරිමයකට යටත්ව ණය මුදලක් ගෙවනු ලැබේ. ණය මුදල් ගෙවීම සහ ආපසු අයකර ගැනීම ලංකා බැංකුව විසින් සිදු කරනු ලබයි.

- ♦ සමාලෝචිත වර්ෂය තුල දි ඉහත යෝජනා ක්‍රමය යටතේ එක් කර්මාන්තයක් සඳහා වන්දි වශයෙන් රු. **1,500,000.00** ක මුදලක් ගෙවන ලදී.

කර්මාන්ත ණය ක්‍රමය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද තෙලිප්පලෙයි වී.ශන්මුගලිංගම් මහතාට අයත් ඇලුමිනියම් කර්මාන්ත ශාලාව.

5. ස්වයං රැකියා ණය ක්‍රමය.

මුලතිව් මාන්කුලම් පාරේ පි.යුහින්දන් මහතා විසින් පවත්වා ගෙන යන "හැපි ටයිම් කුල් බාර්" මෙහි දැක්වේ

යාපනය කරෙයි නගර් හි පදිංචි සන්මුගරාසා මහතා ස්වයං රැකියාව ලෙස (සෙක්කු) තල තෙල් සිදීමේ කර්මාන්තය

මුලතිව් මාන්කුලම් පාරේ පදිංචි විළදය සුදන් මහතා ස්වයං රැකියාවක් වශයෙන් තෝරා ගත් කරණවැමි වෘත්තිය

යාපනය තෙලිප්පලෙයි කේ.කේ.එස් පාරේ සුහන්දන් මහතා ටයර් කඩයක් පවත්වා ගෙන යන අයුරු

ත්‍රස්තවාදී ක්‍රියා/ යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වුවන් සඳහා ආධාර සැපයීම උදෙසා මෙම නව ණය යෝජනා ක්‍රමය ට 2010 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. **4%** ක සහනදායී පොලී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10 ක උපරිමයක ට හා එක් වසරක ණය සහන කාලයක ට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකු ට ලබා ගත හැකි උපරිම ණය මුදල රු. 250,000.00 කි. මෙම ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනු ලබන්නේ උතුරු නැගෙනහිර පළාත් සඳහාය. සමාලෝචිත වර්ෂය තුළදී පහත සඳහන් පරිදි ණය නිදහස් කර තිබුණි.

අනු අංකය	දිස්ත්‍රික්කය	ගෙවූ සංඛ්‍යාව	ගෙවූ මුදල රු.
01	වවුනියාව	23	3,425,000.00
02	මන්නාරම	09	1,550,000.00
03	කිලිනොච්චිය	06	975,000.00
04	මුලතිව්	34	5,970,000.00
05	යාපනය	47	7,125,000.00
06	මඩකලපුව	74	9,466,000.00
07	ත්‍රිකුණාමලය	78	11,360,000.00
08	අම්පාර	600	15,000,000.00
09	අනෙකුත් දිස්ත්‍රික්ක	07	1,425,000.00
	එකතුව	**878**	**56,296,000.00**

6. නිවාස ණය යෝජනා ක්‍රමය.

ත්‍රස්තවාදී ක්‍රියා/ යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ නිවාස වැඩිදියුණු කරගැනීමට ආධාර සැපයීම උදෙසා මෙම නව ණය යෝජනා ක්‍රමය ට 2010 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. 4% ක සහනදායී පොලී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10 ක උපරිමයක ට හා එක් වසරක ණය සහන කාලයක ට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකු ට ලබා ගත හැකි උපරිම ණය මුදල රු. 250,000.00 කි.

* 2012 වර්ෂය තුලදී මෙම නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 15 දෙනෙකු වෙනුවෙන් රු. 3,300,000.00 ක මුදලක් නිවාස ණය වශයෙන් පහත පරිදි නිදහස් කර තිබුණි.

අනු අංකය	දිස්ත්‍රික්කය	ගෙවූ සංඛ්‍යාව	ගෙවූ මුදල රු.
01	යාපනය	01	250,000.00
02	වවුනියාව	01	250,000.00
03	මන්නාරම	08	1,650,000.00
04	ත්‍රිකුණාමලය	05	1,150,000.00
	එකතුව	**15**	**3,300,000.00**

7. පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ක්‍රියාත්මක ස්වයං රැකියා සහන ණය යෝජනා ක්‍රමය.

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ස්වයං රැකියා සහන ණය යෝජනා ක්‍රමයක් 2012.01.31 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල අතර එය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 2012.04.25 දිනැති චක්‍රලේඛය මඟින් ක්‍රියාවට නංවා ඇත.

මේ යටතේ පහත සහනයන් හිමිවේ.

i. අනුමත කළ හැකි උපරිම මුදල රු. 250,000.00 කි.
ii. වාර්ෂික පොලිය 4% කි.
iii. වසරක සහන කාලයකි.
iv. අය කර ගැනීමේ කාලය වසර 10 කි.

මෙම ණය ක්‍රමය පුනරුත්ථාපන අධිකාරිය හා පහත මූල්‍ය ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ.

i. ලංකා බැංකුව
ii. මහජන බැංකුව
iii. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

2012 වසර තුළ මෙම ණය ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 1086 ක් වෙනුවෙන් රු. 178,605,000.00 ක මුදලක් නිදහස් කර ඇත. අදාල මුදල පහත සඳහන් ස්වයං රැකියා කාණ්ඩ යටතේ මුදා හැර තිබුණි.

2012 වර්ෂය සඳහා වූ ප්‍රගතිය පහත පරිදි වේ.

අනු අංකය	ස්වයං රැකියා ක්‍රම	ගෙවූ ණය සංඛ්‍යාව	ගෙවූ ණය මුදල රු.
01	කෘෂි කර්මාන්ත	250	35,620,000.00
02	සත්ත්ව පාලනය	104	15,815,000.00
03	ධීවර කර්මාන්තය	91	19,325,000.00
04	සුළු ව්‍යාපාර	387	62,030,000.00
05	කාර්මික අංශය	99	16,650,000.00
06	කර්මාන්ත	24	3,975,000.00
07	සේවා	28	4,990,000.00
08	ගෘහ ආශ්‍රිත කර්මාන්ත	09	1,450,000.00
09	නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම	47	9,050,000.00
10	වාහන මිලදී ගැනීම	47	9,700,000.00
	එකතුව	**1086**	**178,605,000.00**

මුලතිව් මුල්ලියාවලෙයි පාරේ පදිංචි ටී.ඥාණශිලන් මහතා ස්වයං රැකියාවක් වශයෙන් තෝරා ගත් ඇදුම් මැසීමේ කර්මාන්තය

යාපනය කේ.කේ.එස් පාරේ කන්දසාමි මහතා ස්වයං රැකියාව ලෙස ලි මෝලක් පවත්වා ගෙන යාම

මුලතිව් කල්ලප්පාඩු දකුණෙ හි පදිංචි එස්.ශිවරාජා මහතාගේ කරවල නිෂ්පාදනය

මුලතිව් මුල්ලියාවලෙයි කුමාරපුරම් හි පදිංචි එන්.සෝමසුන්දරම් මහතා වඩු කර්මාන්තයේ නිරත වීම.

පුනරුත්ථාපන අධිකාරිය විසින් අරඹා ඇති නව ව්‍යාපෘති.

01. පුනරුත්ථාපන පාරිසරික මිතුරු ගම්මානය.

පහත සඳහන් ගම්මානවල නිවාස ඉදිකිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර, අධිකාරිය මගින් පවුල් 250 ක් සඳහා නිවාස ආධාර ලබාදී ඇත.

දිස්ත්‍රික්කය	පරිපාලන දිස්ත්‍රික්කය	ග්‍රාමයෙහි නම	පවුල් සංඛ්‍යාව
අම්පාර	මහඔය	සමගිපුර	100
වවුනියාව	වවුනියාව	පරනාට්ටකල්	100
මඩකලපුව	වවුනතිව්	ගාන්ධිනගර්	50

02. ගම්වැසියන්ට යටිතල පහසුකම් ලබාදීම.

අනෙකුත් අමාත්‍යාංශ යටතේ පවතින විවිධ ආයතන මගින් යටිතල පහසුකම් ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත. පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් මෙම කටයුතු සම්බන්ධීකරණ කිරීම මෙන් ම උපදෙස් ලබා දීම ද සිදු කරයි.

03. දිස්ත්‍රික්කයන් තුළ කටයුතු.

ඉහත කටයුතු සම්බන්ධීකරණය කිරීම උදෙසා දිස්ත්‍රික් මට්ටමින් පුනරුත්ථාපන සහකාරවරු බඳවාගෙන තිබෙන අතර, ඔවුන් යාපනය, මුලතිව්, මන්නාරම, වවුනියාව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල රාජකාරියෙහි නිරත වෙති. ඊට අමතර ව පුනරුත්ථාපන අධිකාරියේ උප කාර්යාලය වවුනියාව කච්චේරිය තුළ ක්‍රියාත්මක වන අතර, ඉන් උතුරු පළාතේ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ වඩාත් ශක්තිමත් හා කාර්යක්ෂම ආකාරයෙනි.

ඊ.ඒ. සමරසිංහ,
සභාපති,
පුනරුත්ථාපන අධිකාරිය.

පුනරුත්ථාපන අධිකාරිය.
අංක. 59, ඩී.එස්.සේනානායක මාවත,
කොළඹ 08.

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

(වර්ෂ 1987 අංක 29 දරණ පනත යටතේ ස්ථාපිත)

2012 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

විස්තරය	සටහන්	2012 (රු.)	2011 (රු.)
වත්කම්		1,316,945,694.39	1,300,157,110.25
ජංගම නො වන වත්කම්	13	216,974,057.17	197,411,082.73
දිගු කාලීන ආයෝජන	14	857,334,767.63	882,089,770.13
අයවිය යුතු ණය	15	73,647,007.21	73,647,007.21
භාණ්ඩාගාර තැන්පතු		73,920,691.06	73,920,691.06
ජංගම වත්කම්	16	95,069,171.32	73,088,559.12
වගකීම්		1,316,945,694.39	1,300,157,110.25
සමුච්චිත අරමුදල		337,274,316.48	334,299,336.92
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාව)		(1,283,016.86)	4,217,334.80
වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල		**335,991,299.62**	**338,516,671.72**
ප්‍රත්‍යාගණන ලාභය		5,738,374.50	5,738,374.50
මහා භාණ්ඩාගාරයෙන් ලද වෙනස් වන ප්‍රාග්ධන ප්‍රදාන		198,996,000.00	177,296,000.00
පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම		8,022,924.60	4,832,555.00
ජංගම නො වන වගකීම්	17	764,844,380.00	765,396,770.00
ජංගම වගකීම්	18	3,352,715.67	8,376,739.03

** ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*

** වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

ටී.ඒ. සමරසිංහ
(සභාපති)

එස්.එන්.සී.ඩබ්ලිව්.එම්.ධර්මකීර්ති
(සහකාර අධ්‍යක්ෂ මුදල්)

පී.එස්.විතානගේ
ලේකම්
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

තැනැත්තන් දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යඵල ප්‍රකාශය

විස්තරය	සටහන්	2012 (රු.)	2011 (රු.)
ආදායම්		98,933,560.77	110,235,080.17
භාණ්ඩාගාර ප්‍රදාන	01	86,451,000.00	94,200,000.00
පොලී	02	12,468,160.77	13,565,806.02
වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභය			2,434,394.15
විවිධ ආදායම්		14,400.00	34,880.00
වියදම්		100,216,577.63	106,017,745.37
සාමාන්‍ය පරිපාලන වියදම්		46,487,061.63	45,959,226.37
පෞද්ගලික පඩිනඩි	03	26,683,183.15	23,471,067.44
ගමන් වියදම්	04	180,999.50	290,868.50
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	05	3,268,005.28	2,771,852.59
ස්ථාවර වත්කම් නඩත්තුව	06	2,125,444.51	2,808,936.79
ගිවිසුම්ගත සේවා	07	9,981,866.83	10,345,502.54
වෙනත් පුනරාවර්තන වියදම්	08	1,679,039.35	5,292,875.61
ක්ෂය වීම්	09	2,568,523.01	978,122.90
මෙහෙයුම් ක්‍රියාකාරකම්		53,729,516.00	60,058,519.00
බලවත්සේ විපතට පත්වූවන් සඳහා වන්දි	10	26,677,500.00	25,997,500.00
හානියට පත් දේපළ සඳහා වන්දි	11	27,027,016.00	33,876,019.00
වෙනත් සුභසාධක ක්‍රියාකාරකම්	12	25,000.00	185,000.00
ආදායම ඉක්ම වූ වියදම		(1,283,016.86)	4,217,334.80

** ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*

** වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	සටහන්	2012 (රු.)
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය කාර්යයන්ගෙන් අතිරික්තය / (ඌණතාව)	ඒ	(1,283,016.86)
මුදල් නො වන චලනයන්		
එකතු කලා – ක්ෂය සඳහා වෙන් කිරීම්		2,568,523.01
පාරිතෝෂික වෙන් කිරීම්		3,190,369.60
අඩු කලා – වෙනත් ගැලපීම්	බී	(13,705,945.44)
කාරක ප්‍රාග්ධන ගැලපුම්වලට පෙර අතිරික්තය / (ඌණතාවය)		(9,230,069.69)
ජංගම වත්කම්වල වැඩිවීම	සී	(1,251,040.83)
ජංගම වගකීම්වල අඩුවීම	ඩී	(5,024,023.36)
මෙහෙයුම් කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය		(15,505,133.88)
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ		17,441,428.09
ණය අයකර ගැනීම්	ඊ	2,900,751.03
ආයෝජන	එෆ්	24,755,002.50
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	ජී	(21,812,070.95)
ආයෝජන ආදායම්	එච්	11,597,745.51
මූල්‍යමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය		21,700,000.00
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		21,700,000.00
මුදල් සහ මුදල් සමාන දෑ – ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		23,636,294.21
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	අයි	10,779,640.46
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	ජේ	34,415,934.67

* *ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*
* *වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයිතිය සහ සංචිත වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	පාරිතෝෂික වෙන් කිරීම්	ප්‍රත්‍යාගණන සංචිතය	එකතුව
2012.01.01 දිනට ශේෂය	338,516,671.72	4,832,555.00	5,738,374.50	349,087,601.22
වර්ෂයට අදාළ වෙන් කිරීම් (ශුද්ධ)		3,190,369.60		3,190,369.60
පෙර වර්ෂවල වියදම්	(1,255,855.24)			(1,255,855.24)
පෙර වර්ෂවල ආදායම්	13,500.00			13,500.00
2012 වර්ෂයේ ශුද්ධ ඉතිරිය / (හිඟය)	(1,283,016.86)			(1,283,016.86)
2012.12.31 දිනට ශේෂය	335,991,299.62	8,022,924.60	5,738,374.50	349,752,598.72

මූල්‍ය වාර්තා සඳහා සටහන්

	2012 (රු.)	2011 (රු.)
01 **භාණ්ඩාගාර ප්‍රදාන**	**86,451,000.00**	**94,200,000.00**
භාණ්ඩාගාර අක්මුදල් - පුනරාවර්තන	86,451,000.00	94,200,000.00
02 **පොළී**	**12,468,160.77**	**13,565,806.02**
රු. 200,000/= ලංකා බැංකු ණය සඳහා පොළී		115,061.65
ණය දෙන ආයතනවලින් ලද පොළී		
ලංකා බැංකුව	1,255,000.00	3,587,602.71
මහජන බැංකුව	3,500,535.63	3,880,500.00
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	377,742.23	430,139.49
හැටන් නැෂනල් බැංකුව	75,000.00	120,000.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	200,000.00	1,920,000.00
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ආයෝජන	1,869,045.00	200,000.00
ලංකා බැංකු නව ණය යෝජනා ක්‍රමය	4,050,162.07	2,223,876.65
පාරිතෝෂික ආයෝජන සඳහා පොළී	361,151.58	359,848.66
සේවක ණය සඳහා පොළී		
දේපළ ණය	532,952.14	448,980.59
ආපදා ණය	244,552.52	277,868.47
විශේෂ අත්තිකාරම්	2,019.60	1,927.80
03 **පෞද්ගලික පඩිනඩි**	**26,683,183.15**	**23,471,067.44**
කාර්යය මණ්ඩල වැටුප්	12,109,012.03	12,622,113.47
සේ.අ.අ. දායක මුදල්	2,215,524.42	2,010,286.45
සේ.නි.භා.අ. දායක මුදල්	553,881.08	502,571.36
විශ්‍රාම වැටුප් දායක මුදල්		145,058.95
අතිකාල හා නිවාඩු දින වැටුප්	740,237.89	976,979.47
ජීවන වියදම් දීමනාව	3,948,262.50	3,992,362.50
සභාපති දීමනා	600,000.00	520,000.00
ක්‍රියාකාරී අධ්‍යක්ෂ දීමනා	460,000.00	240,000.00
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	52,000.00	77,000.00
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	48,000.00	48,000.00
ද්විතීයන දීමනා	1,592.10	145,058.95
විශේෂ දීමනා	1,755,807.97	620,139.49
වෙනත් දීමනා	753,769.33	754,080.50
භාෂා දීමනා	95,152.80	88,431.30

පාරිතෝෂික වියදම්	3,349,943.03	728,985.00
04 **ගමන් වියදම්**	**180,999.50**	**290,868.50**
ගමන් වියදම් - දේශීය	180,999.50	290,868.50
05 **සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය**	**3,268,005.28**	**2,771,852.59**
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	952,567.72	818,611.88
ඉන්ධන හා ලිහිසි තෙල්	2,139,809.56	1,778,240.71
නිල ඇඳුම්	67,928.00	65,380.00
පුවත්පත් සහ සඟරා	107,700.00	109,620.00
06 **ස්ථාවර වත්කම් නඩත්තුව**	**2,125,444.51**	**2,808,936.79**
ස්ථාවර වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව	488,130.04	280,094.45
වාහන අලුත්වැඩියා හා නඩත්තුව	1,637,314.47	2,528,842.34
07 **ගිවිසුම්ගත සේවා**	**9,981,866.83**	**10,345,502.54**
දුරකථන ගාස්තු	487,634.00	551,378.51
තැපැල් ගාස්තු	376,297.00	305,754.00
විදුලිය බලය සහ අනෙකුත් පහසුකම්	1,001,268.48	972,014.40
කුලී	5,100,000.00	5,025,000.00
වාහන කුලී	1,114,731.60	1,167,741.00
මුද්‍රණ ගාස්තු	594,892.80	1,106,155.63
සංග්‍රහ වියදම්	1,137,042.95	1,047,459.00
විගණන ගාස්තු	150,000.00	150,000.00
පොලී මත රඳවා ගැනීමේ බදු	20,000.00	20,000.00
08 **වෙනත් පුනරාවර්තන වියදම්**	**1,679,039.35**	**5,292,875.61**
සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම්	145,134.50	150,000.00
සේවකයින් සඳහා වෛද්‍ය රක්ෂණය	447,176.40	409,230.32
විවිධ වියදම්	997,901.75	4,306,538.79
සුභසාධක වියදම්	49,900.80	117,977.00
නීති ගාස්තු		114,500.00
ජාතික සංවර්ධන බැංකු පොළී	38,925.90	194,629.50
09 **ක්ෂයවීම්**	**2,568,523.01**	**978,122.90**
ක්ෂය - මෝටර් වාහන	1,562,633.00	32,047.43
ක්ෂය - ලීබඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම්	270,548.66	317,468.14
ක්ෂය - කාමර වෙන් කිරීම්	116,196.00	152,266.00
ක්ෂය - දුරකථන	36,170.84	42,670.40

ක්ෂය - යන්ත්‍ර	193,228.00	175,262.43
ක්ෂය - පරිගණක	312,134.90	258,408.50
ක්ෂය - වායු සමීකරණ	77,611.61	
10 බලවත්සේ විපතට පත්වූවන් සඳහා වන්දි	**26,677,500.00**	**25,997,500.00**
රජයේ සේවක	3,450,000.00	6,195,000.00
සාමාන්‍ය මහජන	23,227,500.00	19,802,500.00
11 හානියට පත් දේපළ සඳහා වන්දි	**27,027,016.00**	**33,876,019.00**
රජයේ සේවක	13,448,279.00	17,473,674.00
සාමාන්‍ය මහජන	13,378,737.00	15,402,345.00
පූජනීය ස්ථාන	200,000.00	1,000,000.00
12 වෙනත් සුභසාධක ක්‍රියාකාරකම්	**25,000.00**	**185,000.00**
විපතට පත් ශිෂ්‍යයින් වෙනුවෙන් ශිෂ්‍යාධාර වැඩසටහන		185,000.00
විවාහ සමෘද්ධි දීමනා	25,000.00	
13 ජංගම නො වන වත්කම්	**216,974,057.17**	**197,411,082.73**
පිරිවැය		
වර්ෂයේ ආරම්භක අගය	25,189,552.85	20,390,439.18
වර්ෂය තුළ එකතු කිරීම්	1,181,497.45	7,107,507.17
වර්ෂය තුළ ඉවත් කිරීම් (ප්‍රත්‍යාගණන වත්කමේ ගත් මිල)		2,308,393.50
වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකම		
වර්ෂ අවසාන අගය	**26,371,050.30**	**25,189,552.85**
ක්ෂය		
වර්ෂයේ ආරම්භක අගය	15,341,555.12	16,650,830.12
එකතු කලා :- වර්ෂය සඳහා ක්ෂය	2,568,523.01	978,122.90
ජ'නල් සටහන් අංක 02	350,000.00	
අඩු කලා :- වර්ෂය තුළ මාරු කිරීම්		2,287,397.90
වර්ෂ අවසාන අගය	**18,260,078.13**	**15,341,555.12**
ශුද්ධ පොත් අගය		
වර්ෂ අවසාන අගය *විස්තර සඳහා සටහන් නො. 12-1 බලන්න*	**8,110,972.17**	**9,847,997.73**
නිවාස ආධාර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	208,863,085.00	187,563,085.00
14 දිගු කාලීන ආයෝජන	**857,334,767.63**	**882,089,770.13**
ඒ.ස.කු යටතේ ණය දෙන ආයතනවලට ලබා දුන් අරමුදල් (විස්තර සඳහා සටහන් නො. 13-1 බලන්න)	852,502,212.63	877,762,212.63

පාරිතෝෂික ආයෝජන	4,832,555.00	4,327,557.50
15 ණය අයකිරීම්	**73,647,007.21**	**73,647,007.21**
රු. 200,000/= ලංකා බැංකු ව්‍යාපාරික ණය	4,681,213.68	4,681,213.68
රු. 25,000/= ලංකා බැංකු දේපළ යථාවත් කිරීමේ ණය	67,341,609.58	67,341,609.58
අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	(6,736,352.14)	(6,736,352.14)
රු.10,000/= ලංකා බැංකු ස්වයං රැකියා ණය	9,289,484.54	9,289,484.54
අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	(928,948.45)	(928,948.45)
16 ජංගම වත්කම්	**95,069,171.32**	**73,088,559.12**
දේපළ ණය	9,277,091.74	10,708,028.00
සේවක ණය (ආපදා)	4,938,404.53	6,162,549.39
ගංවතුර අත්තිකාරම්	45,494.91	286,864.82
උත්සව අත්තිකාරම්	89,000.00	93,300.00
ණය දෙන ආයතනවලින් ලැබිය යුතු පොළී	43,870,837.96	43,062,118.85
පාරිතෝෂික ආයෝජනවලින් ලැබිය යුතු පොළී	557,348.66	515,652.51
ලැබිය යුතු ලැබීම්	239,612.06	182,330.03
පෙර - ගෙවුම්	347,921.48	91,748.82
තොග (ලිපි ද්‍රව්‍ය)	377,525.31	296,326.24
ණය ගැතියෝ	910,000.00	910,000.00
බැංකු ශේෂ	34,415,934.67	10,779,640.46
17 ජංගම නො වන වගකීම්	**764,844,380.00**	**765,396,770.00**
ඒ.ස.කු. යටතේ ණය දීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ - අරමුදල්	764,544,380.00	764,544,380.00
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	300,000.00	852,390.00
18 ජංගම වගකීම්	**3,352,715.67**	**8,376,739.03**
උපචිත වියදම්	966,157.17	300,409.33
තැන්පත් ගිණුම	2,386,558.50	8,076,329.70

සටහන් නො. 12-1

ජංගම නො වන වත්කම්
2012

	මෝටර් වාහන	ලීබඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම්	යන්ත්‍ර	දුරකථන	කාමර වෙන් කිරීම්	පරිගණක	වායු සමීකරණ	එකතුව
පිරිවැය								
2012.01.01 දිනට ශේෂය	10,751,570.00	6,095,580.41	1,560,224.50	843,481.51	1,522,660.00	2,040,242.60	2,375,793.83	25,189,552.85
වර්ෂය තුළ එකතු කිරීම්		393,381.96		25,150.00		93,538.99	669,426.50	1,181,497.45
වර්ෂය තුළ අපහරනය කිරීම්								
2012.12.31 දිනට ශේෂය	10,751,570.00	6,488,962.37	1,560,224.50	868,631.51	1,522,660.00	2,133,781.59	3,045,220.33	**26,371,050.30**
ක්ෂය කිරීම්								
2012.01.01 දිනට ශේෂය	4,559,316.09	4,509,295.34	1,061,301.08	709,357.72	944,572.62	1,181,918.44	2,375,793.83	15,341,555.12
ජ'නල් සටහන් අංක 02	350,000.00							350,000.00
වර්ෂය සඳහා වෙන් කිරීම්	1,562,633.00	270,548.66	193,228.00	36,170.84	116,196.00	312,134.90	77,611.61	2,568,523.01
වර්ෂය තුළ මාරු කිරීම්								
2012.12.31 දිනට ශේෂය	6,471,949.09	4,779,844.00	1,254,529.08	745,528.56	1,060,768.62	1,494,053.34	2,453,405.44	**18,260,078.13**
2012.12.31 දිනට ශුද්ධ පොත් අගය	4,279,620.91	1,709,118.37	305,695.42	123,102.95	461,891.38	639,728.25	591,814.89	**8,110,972.17**

සටහන් නො. 13-1

2012.12.31 දිනට ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණය දෙන ආයතනවලට ලබා දුන් අරමුදල් අත්තිකාරම්

ආයතනය	ලෙජර පිටුව	නිවාස ණය	ව්‍යාපාරික ණය	කර්මාන්ත ණය	ස්වයං රැකියා ණය	නව නිවාස ණය	එකතුව
ලංකා බැංකුව	38,50	44,500,000.00	2,500,000.00	21,000,000.00	369,987,000.00	58,502,000.00	496,489,000.00
මහජන බැංකුව	41	193,200,000.00					193,200,000.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	49	124,603,000.00					124,603,000.00
හැටන් නැෂනල් බැංකුව	43	3,751,945.57	1,248,054.43				5,000,000.00
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	47	23,210,212.63					23,210,212.63
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	45	10,000,000.00					10,000,000.00
එකතුව		399,265,158.20	3,748,054.43	21,000,000.00	369,987,000.00	58,502,000.00	**852,502,212.63**

සටහන් නො. 13-2

ණය දෙන ආයතනවලින් ලැබිය යුතු පොලී

ආයතනය	ලෙජර පිටුව	මුදල රු.
ලංකා බැංකුව	22	1,255,000.00
මහජන බැංකුව	24	3,500,535.62
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	33	34,509,045.00
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	31	377,824.42
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	28	178,270.84
ලංකා බැංකු නව ණය යෝජනා ක්‍රමය	36	4,050,162.08
එකතුව		**43,870,837.96**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல My No.	ජේපී/ඒ/ආර්පීපීඅයිඒ/ එෆ්ඒ/2012/02	ඔබේ අංකය உமது இல No.		දිනය திகதி Date	2014 ජනවාරි 31 දින

සභාපති
තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනතේ 8(2) වගන්තිය සමග සංයෝජිතව තියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2013 ඔක්තෝබර් 30 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම.</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி. பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම.</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන.</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය.</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු .</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(ඇ) සම්පූර්ණ වශයෙන් ක්ෂයවී ඇති නමුත් අඛණ්ඩව භාවිතයේ පවතින රු.7,491,247 ක් වූ වත්කම් අයිතම 04 ක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.4,900,000 ක් වූ මෝටර් රථයක් ගිණුම් ප්‍රකාශවලට ඇතුළත්ව නොතිබුණු අතර ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනද සලසා නොතිබුණි.

2.2.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි භාණ්ඩාගාර තැන්පත් ලෙස දක්වා ඇති රු.73,920,691 ක ශේෂය පිළිබඳ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) අධිකාරිය විසින් ඒකාබද්ධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා බැංකු 2 ක් වෙත සපයන ලද රුපියල් මිලියන 44.5 ක් හා රුපියල් මිලියන 193.2 ක් වූ අරමුදල් වලින් එම බැංකු විසින් නිකුත් කර තිබූ ණය මුදල් හා ශේෂයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.2.3 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරුණු ලැබේ.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව.	අනුකූල නොවීම
(අ). <u>ආයතන සංග්‍රහය.</u>	
(i). iv වන පරිච්ඡේදයේ 5.8වගන්තිය සහ 2004 දෙසැම්බර් 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය	2001 ජනවාරි 15 දින දත්ත සැකසුම් ක්‍රියාකරු තනතුරට පත්කරන ලද නිලධාරිනිය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබියදී 2006 මැයි 09 දින සිට කළමණාකරණ සහකාර II පන්තියට අන්තර්ග්‍රහණය කර වැටුප් වර්ධක 12 ක් උපයාගත් පියවරක වැටුප පිහිටුවා 2009 නොවැම්බර් 16 දින සේවයේ ස්ථිර කර තිබුණි.
(ii). xiv පරිච්ඡේදයේ 1.3 වගන්තිය	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සංයුක්ත දීමනා ලෙස සලකන්නේ නවාතැන් සහ යැපීම් වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම වශයෙන් ගෙවන මුදල් වේ. අධිකාරියේ නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරි වල නිරතවීමේදී ඒ සඳහා නවාතැන්, ආහාරපාන සඳහා රු.460,863 ක මුදල් ලබාගෙන තිබූ අතර ඊට අතිරේකව එම ගමන් වෙනුවෙන් රු.86,857 ක සංයුක්ත දීමනාද ලබාගෙන තිබුණි.
(iii).xxiv පරිච්ඡේදයේ 11.1 වගන්තිය සහ 2005 මාර්තු 31 දිනැති 08/2005 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දේපල ඇප වශයෙන් තබා මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක් බේරුම් කිරීම සඳහා ණයක් ලබාගැනීමට ඉල්ලුම් කර තිබූ නිලධාරිනියකට රු.987,600 ක දේපල ණය මුදලක් අනුමත කර ගෙවා තිබුණි.
(ආ)1994 ජුනි 14 දිනැති 95 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන ඡේදය	විවිධ කාර්ය මණ්ඩල ශ්‍රේණි වලට රාජකාරි ගමන් සඳහා රු.10,500 ක විශේෂ දීමනා ගෙවීම් කර තිබුණද, ඊට භාණ්ඩාගාර අනුමැතිය ලබා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය.

3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් රු.1,283,017 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,217,335 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,500,352 ක් වූ පිරිහීම සඳහා ආදායම් රු.11,301,520 කින් සහ වන්දි ගෙවීම් රු.6,329,003 කින් අඩුවීමත් පරිපාලන වියදම් රු.527,835 කින් වැඩිවීමත් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා.

~~පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.~~

(අ) 2009 වර්ෂයේ අනතුරට පත්වූ වාහනය වෙනුවෙන් ලැබිය යුතු රු.44,300 ක වන්දි අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම උදෙසා නිවාස සංවර්ධන අධිකාරිය වෙත දී තිබූ මුදලින් ගිවිසුම් කාල සීමාව අවසන්ව තිබුණ ද අයවීමට ඇති රුපියල් මිලියන 124.3 ක් සහ ඊට අදාල පොලිය අය කරගෙන නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය.

අධිකාරිය ආයෝජනය කර තිබූ රු.70,500,000 ක් ආපසු ලබාගෙන ස්වයං රැකියා හා නව නිවාස ණය ලබාදීම සඳහා රු.46,989,000 ක් නැවත ආයෝජනය කර ඇතත්, ඉතිරි රු.23,511,000 ක් කිසිදු ආයෝජනයක නොයොදා මාස 2 1/2 ක් අත රඳවාගෙන තිබුණි.

4.3 සේවක පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.

සේවක පාර්තෝෂිත වශයෙන් වෙන්කර තිබූ රු.3,349,943 ක් අරමුදලක් ගොඩනැගීම සඳහා ආයෝජනය කර නොතිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය.

5.1 අභ්‍යන්තර විගණනය.

අධිකාරියේ සියළු ගනුදෙනු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

5.2 <u>අයවැය පාලනය.</u>

අයවැයගත හා සත්‍ය වියදම් අතර 3% සිට 3184% දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන ඒකකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලන.</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සදහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල කළ යුතුවේ.

(අ). ස්ථාවර වත්කම්

(ආ). අයවැය පාලනය.

(ඇ). නිවාස ආධාර ව්‍යාපාති

(ඈ). වන්දි ගෙවීම්.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

REP / F / 1 / 7 2013.11.18

විගණකාධිපතිතුමා.
විගණකාධිපති දෙපාර්තමේන්තුව.
බත්තරමුල්ල.

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ ජේපී / ඒ / ආර්පීපීඅයිඒ / එෆ්ඒ / 2012 / 02 සමාංක හා 2013 නොවැම්බර් 05 වන දිනැති කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් මාගේ නිරීක්ෂණයන් පහතින් දක්වා ඇත.

<u>2.2 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ අදහස් දැක්වීම.</u>

<u>2.2.1 ගිණුම්කරණ අඩුපාඩු</u>

I. 2013 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය සිදු කර ඇත. ඒ අනුව ප්‍රත්‍යාගණන අගයන් 2013 අවසන් ගිණුම් මගින් ගලපනු ලැබේ.

II. 2013 වර්ෂයේ දී අවසන් ගිණුම්වලට ඇතුළත් කර අදාළ ගැළපීම් සිදු කිරීමට කටයුතු කරමි.

<u>2.2.2 විගණනය සඳහා සාක්ෂි නො වීම</u>

I. පුනරුත්ථාපන අධිකාරිය, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අතර, සිදු වූ ලිපි හුවමාරුවකින් අනතුරු ව 2013.07.29 දිනැති ව අදාළ ශේෂය රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර, 2013 අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී අදාළ ගැලපීම සිදු කරනු ඇත.

II. අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. ඉදිරියේ දී විගණනය සඳහා වු තොරතුරු ප්‍රමාදයකින් තොර ව ලබාදීමට ක්‍රියා කරනු ලැබේ.

2.2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නො වීම

(අ)

I. නිරීක්ෂණ නිවැරදි ය. ඉදිරියේ දී බඳවා ගැනීම් කටයුතු නිසියාකාර ව සිදු කිරීමට කටයුතු කරමි.

II. (අ)

පුනරුත්ථාපන අධිකාරිය සතු ව කිසිදු ක්ෂේත්‍රගත නිලධාරියෙකු නොමැත. කාර්යාලගත නිලධාරීන් විසින් කාර්යාලීය රාජකාරීවලට අමතර ව ක්ෂේත්‍ර රාජකාරීවල නිරත වේ. මෙම ආයතනයට පැවරී ඇති ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම දෙකට අදාළ ව විශාල ක්ෂේත්‍ර රාජකාරී ප්‍රමාණයක් ඉටුකර ගත යුතු ව ඇත. ක්ෂේත්‍ර රාජකාරීවල නියැලීම සඳහා මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු හා දෙමළ භාෂාව කථා කරන කළමනාකරණ සහකාරවරු දෙදෙනෙකු පමණක් 2012 වසර තුළ සිටි බැවින් ඔවුන්ට නැවත නැවත සති අන්ත රාජකාරී කටයුතුවල නිරත කිරීමට සිදු විය. 2012 වසරේ ආරම්භ කරන ලද පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අධිකාරියට භාරදීමත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ආයතන, මුදල් අමාත්‍යංශය හා මෙම අධිකාරිය ඒකාබද්ධව ඇතිකරගත් ණය ගිවිසුම අනුව ක්ෂේත්‍ර රාජකාරී ප්‍රමාණය, පැවති ක්ෂේත්‍ර රාජකාරී ප්‍රමාණයට වඩා 100% කින් වැඩි කිරීමට සිදුවිය. මෙම රාජකාරී ණය ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව ඉටුකළ යුතු අනිවාර්‍ය රාජකාරී විය.

ඉහත හේතූන් මත අදාළ ගෙවීම් කිරීමට සිදු විය.

(ආ)

ආයතන සංග්‍රහය හෝ චක්‍රලේඛ උල්ලංඝණය කරමින් සංයුක්ත දීමනාව වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කිසිදු තීරණයක් ගෙන නොමැත. 2012.12.10 දිනැති ව පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්ෂේත්‍රගත රාජකාරී සඳහා විශේෂ දීමනාවක් ලබාදීමට අනුමත කළ ද, එය සංයුක්ත දීමනාව වැඩි කිරීම හෝ එම දීමනාව අත්හිටුවීම නිසා අනුමත කරන ලද දීමනාවක් නො වන බව ද දන්වා සිටිමි. එවැනි විශේෂ දීමනා ගෙවීම් සිදු කරනුයේ අමාත්‍ය මණ්ඩලය විසින් පුනරුත්ථාපනය කරන ලද එල්.ටී.ටී.ඊ සාමාජිකයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අධිකාරිය වෙත පැවරීම හේතුවෙන් පැවති ක්ෂේත්‍රගත රාජකාරී ප්‍රමාණය 100% කින් වැඩි කිරීමට සිදු වීමයි. මේ අනුව

- ❖ පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්ෂේත්‍රගතව පැවැත්වීම.
- ❖ ණයලාභීන් තෝරා ගැනීමට දිස්ත්‍රික් මට්ටමේ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට සිදු වීම
- ❖ ඔවුන්ගේ ණය ගැටළු පිළිබඳ ව සොයා බැලීමට ක්ෂේත්‍රගත රැස්වීම සංවිධානය කිරීම.
- ❖ ණයලාභීන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘති 4000 ක් 2012 වසර තුළ පසු විපරම් කිරීම 2012 ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදු කිරීම.
- ❖ ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව යන මූල්‍ය ආයතනවල ශාඛා සම්බන්ධීකරණය කරමින් මිලියන 300 ක ණය සීමිත කාලයක් තුළ නිදහස් කිරීමට සිදු වීම.

මෙම තත්ත්වය තුළ රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් දිවා රාත්‍රී , සති අන්ත හෝ රජයේ නිවාඩු දින නො සලකා යෙදවීම අරමුණු කර ගනිමින් සහ එසේ ම ක්ෂේත්‍ර රාජකාරීවල නියැලෙන අවස්ථාවල දී ඔවුන්ගේ කාර්යාලීය රාජකාරී ආවරණය කිරීමට නිලධාරීන් නොමැති බැවින් ක්ෂේත්‍රගත රාජකාරීවල නිරත වූ නිලධාරීන් විසින් ම ක්ෂේත්‍රගත වීම හේතු කොටගෙන අතපසුවන කාර්යාලීය රාජකාරීවල නියැලීමත්, රාජකාරී විධිමත්ව හා කාර්යක්ෂම ව පවත්වාගෙන යාමට දිරිදීමක් වශයෙනුත් මෙම විශේෂ දීමනාව පහත සඳහන් කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී,

- ❖ මසකට දින 05 ක ට පමණක් විශේෂ දීමනාව ගෙවීම
- ❖ රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබෙන ප්‍රතිපාදන යොදා නො ගැනීම
- ❖ මේ සඳහා 2012 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ණය සුපරීක්ෂණ වැඩසටහන සඳහා වෙන් කරන ලද ණය යෝජනා ක්‍රමය සඳහා මුල්‍ය ආයතන විසින් පුනරුත්ථාපන අධිකාරියට ගෙවනු ලබන 1% පොළී ප්‍රතිශතයක් වූ සේවා ගාස්තුවෙන් කොටසක් මෙම දීමනාව සඳහා යොදා ගැනීම.

III. නිරීක්ෂණය නිවැරදි ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

I. මුල්‍ය ආයතන සමග මෙවැනි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී ණය නිකුත් කරනු ලබන ප්‍රමාණය මත ඒ ඒ කාල පරිච්ඡේද සඳහා චක්‍රීය අරමුදල් මුල්‍ය ආයතන වෙත නිදහස් කිරීම සිදු වේ. මෙවැනි තත්ත්වයන් ප්‍රායෝගික වන අතර කෙසේ නමුත් ඉදිරියේ දී මෙම තත්ත්වය මග හරවාගෙන කටයුතු කිරීමට ක්‍රියා කරනු ලැබේ

II. අදාළ වන්දි මුදල ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි.

III. පුනරුත්ථාපන අධිකාරිය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති ඇතුළු නිලධාරීන් සමග සාකච්ඡා කර එම මුදල් පුනරුත්ථාපන අධිකාරිය විසින් තෝරා නම් කරනු ලබන උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඉල්ලුම්කරුවන්ට ලබා දීමට එකග විය. ඒ අනුව පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියට අය විය යුතු ශේෂය සඳහා එම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලද අතර, අදාළ පොළී මුදල් ප්‍රමාණය කපා හැරීමට එකග විය. එහෙත් ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පැහැදිලි ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැත. නිවාස හා ඉදිකිරීම් හා ඉන්ජිනේරු සේවා අමාත්‍යාංශය විසින් ද මෙම කාර්යයට විසඳුමක් ලබා දෙන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලිපි මගින් දන්වා ඇත. එමෙන් ම, මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳ ව උපදෙස් ඉල්ලා මහා භාණ්ඩාගාරයට ලිපි මගින් දන්වා ඇත. ඒ අනුව පුනරුත්ථාපන අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර ඉහත සඳහන් කරන ලද වැඩසටහන ක්‍රියාවට නැංවීමට සියළු ම උත්සාහයන් දරණ ලද නමුත් ඒ සඳහා නිවාස සංවර්ධන අධිකාරිය ප්‍රමාණවත් උනන්දුවක් නො දැක්වීම හේතුවෙන් මේ දක්වා අදාළ වැඩසටහන ක්‍රියාවට නැංවීමට අපොහොසත් වී ඇත. එමෙන් ම ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මගින් නිසි උපදෙස් ලබාගෙන කටයුතු කිරීමට බලාපොරොතතු වේ.

4.2 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩ නැගීම

අදාළ පාරිතෝෂික වෙන්කිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සඳහා භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලද නමුත්, 2013.10.11 දිනැති ව සමාංක බීඩී/ජේඑල්ප් 174/2/2 දරණ ලිපිය මගින් මේ සඳහා ප්‍රතිපාදන ලබා දීම මේ අවස්ථාවේ දී සිදු කිරීමට නො හැකි බව දන්වා සිටින ලදී, ආයතනයේ මූල්‍ය හැකියාව අනුව ඉදිරියේ දී අදාළ පාරිතෝෂික ආයෝජනය කොටස් වශයෙන් ආයෝජනය කිරීමට කටයුතු කරමි. (ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

5 ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අධිකාරියේ සියළු ගනුදෙනු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණයට යටත් ව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වේ.

5.2 අයවැය පාලනය

අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලකයක් ලෙස යොදා ගැනීමට උපරිමයෙන් කටයුතු කරනු ලබන අතර, විශේෂිත අවස්ථාවන් හා කාරයයන් හේතුකොට බැහැරවීම් සිදු වේ.

6 පද්ධති හා පාලනය

(අ) ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම කරගෙන යනු ලැබේ (ආ), (ඇ), (ඈ) නිසි පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කොට ඇත.

ටී. ඒ. සමරසිංහ.
සභාපති.